# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,038 - 2017 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2017.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2017 සැප්තැම්බර්

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් ස්ථිර කිරීමට පෙර හා මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරක නිලධාරියකු එකී පත්වීම් දින සිට දෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2017.10.21 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* :

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද, මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරින් පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

03. *අයදුම්පත්* :

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත 2017.09.22 වැනි දින හෝ ඊට ප්‍රථම භාර දිය යුතු ය. සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ බවට ආයතන ප්‍රධානීන් විසින් සහතික කරන ලද අයදුම්පත් කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ''සුවසිරිපාය'' අධ්‍යක්ෂ (විභාග) වෙත 2017.09.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. සෑම අයදුම්පත්‍රයකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. තම අයදුම්පත සමඟ ලිපිනය ලියන ලද රු. 35ක් වටිනා මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවර 2ක් ද එවිය යුතු ය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිතවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ. යු* : ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව, අයදුම්පත්‍රය A4 වර්ගයේ කඩදාසියක පළමු පිටුවේ අංක 1 සිට 4 (ඉ) දක්වාත් දෙවන පිටුවේ අංක 4 (ඊ) සිට අංක 9 දක්වාත් සකස් කළ යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සහ අසම්පූර්ණ සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු* :

(i) විභාගයට පළමුවන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන සහ දිනය යොදා ඒවා නිසිලෙස අවලංගු කළ යුතු ය.

(ii) කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

(i) පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii) විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළ දී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.
ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්-පත්‍රය;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;

(iii) කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකි ය. එසේ ඔබේ නමට අදාළ විභාග අංකය හා විභාග මධ්‍යස්ථානය සොයා ගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිළධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකි ය. ප්‍රවේශ පත්‍ර ලැබුණු අයදුම්කරුවන් අත්සන සහතික කර රැගෙන පැමිණිය යුතු ය. අත්සන සහතික කරන ලද ලිපිය හෝ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්හට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. (වෙබ් අඩවිය-www. health. gov.lk)

06. *විභාග පරිපාටිය* :
මෙම විභාගය ලිඛිත රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විත ය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත් වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබා ගත යුතු ය. එක් වරකදී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකි ය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියළුම විෂයන්ට පෙනී සිටිය යුතු ය.

07. *විභාග විෂය නිර්දේශ මාලාව* :

07:1 ලිඛිත විභාගය

07:1:1 ආයතන සංග්‍රහය - ප්‍රශ්න පත්‍රය
කාලය පැය 02 යි, ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.

විෂය නිර්දේශය :

(i) සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි,
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි,
(iii) ආයතන සංග්‍රහය :

I කොටස — VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII පරිච්ඡේදයන්,

II කොටස — XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්.

07:1:2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :

සෞඛ්‍ය සේවා සංග්‍රහය -

(i) රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
(ii) රසායනාගාර සේවා කළමණාකරණය
(iii) ඖෂධ කළමණාකරණය

07:1:3 ගිණුම් ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතුය.

විෂයය නිර්දේශය :

(i) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි;
(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස;
(iii) වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මු. රෙ. 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මු. රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මු. රෙ. 124, 125, 126, 127, 128, 131,133,134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මු. රෙ. 200, 201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මු. රෙ. 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මු. රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මු. රෙ 715, 716, 756, 757, 758 |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

1 වැනි පරිච්ඡේදය - සියළුම වගන්ති.
2 වැනි පරිච්ඡේදය - 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8
3 වැනි පරිච්ඡේදය - 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9

07:2 සිංහල/දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරීන්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරින්ට සිංහල මාධ්‍යයෙන් ද සන්නිවේදනය කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10කි.

08. *විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම* :

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොළයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම් ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතු ය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

09. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයෙහි නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ඔක්තෝබර් මස 13 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 සැප්තැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙම තොරතුරු www.health. gov.lk වෙබ් අඩවියේ ද ඇතුලත් කර ඇත.

*සැ. යු.* : විභාග නිවේදනයේ දෙමළ සහ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත්වේ.

එම්. බී. එල්. රහුමාන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II,
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

2017 අගෝස්තු මස 28 වැනි දින,
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
''සුවසිරිපාය''
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත**

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2017 සැප්තැම්බර්**

01 (*අ*) (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(*ආ*) (i) නිළ නාමය (අදළ කොටුව තුළ ( √ ) ලකුණ යොදන්න.

I වෛද්‍ය නිලධාරි ☐ II දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි ☐

(ii) සීමාවාසික පත්වීම ලද දිනය :————.

(iii) ප්‍රාථමික ශ්‍රේණියට / II ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ ( √ ) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ☐ ආයතන සංග්‍රහය ☐ ගිණුම් ☐

සිංහල වාචික ☐ දෙමළ වාචික ☐

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (අදළ කොටුවේ ( √ ) හරි ලකුණ යොදන්න.) :

සිංහල ☐ ඉංග්‍රීසි ☐ දෙමළ ☐

04. (*අ*) (i) දැනට සේවය කරන ආයතනය (පැහැදිලිව සඳහන් කරන්න.) :————.

(ii) මෙම ආයතනය අයත් වන්නේ -

රේඛීය අමාත්‍යාංශයට ☐

පළාත් සභාවට ☐

(*ආ*) (i) පළාත් සභාවට නම් අදාළ පළාත :————.
(ii) එය අයත් දිස්ත්‍රික්කය :————.

(*ඇ*) ජංගම දුරකථන අංකය :

(*ඈ*) ජාතික හැඳුනුම්පත් අංකය :

(*ඉ*) පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමැති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ ( √ ) හරි ලකුණ යොදන්න. (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර එකී මධ්‍යස්ථානයට අයදුම් කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)

| | | | |
|---|---|---|---|
| කොළඹ ☐ | කඳාන ☐ | හම්බන්තොට ☐ | අම්පාර ☐ |
| කළුතර ☐ | ගාල්ල ☐ | බදුල්ල ☐ | වව්නියා ☐ |
| කුරුණෑගල ☐ | අනුරාධපුර ☐ | රත්නපුර ☐ | පොළොන්නරුව ☐ |
| මහනුවර ☐ | මඩකලපුව ☐ | යාපනය ☐ | ත්‍රිකුණාමලය ☐ |

(*ඊ*) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රුපියල් 35 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද? :————.

(*උ*) (i) තැපැල් ලිපිනය (සිංහලෙන්) :————.
(ii) තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

05. (*අ*) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ? :————.
(*ආ*) විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේ ද? :————.

මුද්දර කොටුව (මුද්දර අලවා ඒ මත අත්සන තබන්න.)

06. *අයදුම්කරුගේ සහතිකය* :

මගේ දැනුම හා විශ්වාසය පරිදි —

(i) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් ප්‍රථම වතාවට නොවන බැවින් රු.... ක් වටිනා මුද්දර අලවා ඇති බවත් මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාග ාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟවන බවත් සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

07. *පෞද්ගලික ලිපිගොනු බාර විෂය නිලධාරියාගේ/නිලධාරිණියගේ සහතිකය* :

මෙම අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත් මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

————,
දිනය :————. නම සහ අත්සන.

08. *ආයතන ප්‍රධානියාගේ සහතිකය* :

.......................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු වන අතර, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැ රදි බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට වන/නොවන බවට ද රු.................. ක් වටිනා මුද්දර මෙම මුද්දර අයදුම් පත්‍රයට අලවා ඇති බව ද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවට ද මා ඉදිරිපිටදී අත්සන් කළ බව ද සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
දිනය :————. (රබර් මුද්‍රාව තැබිය යුතුය)

09. *විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය* :

.......................... මහතා/මහත්මිය/මෙනවිය වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පත්‍රයෙහි දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන.
(රබර් මුද්‍රාව තැබිය යුතුය).

දිනය :————.

(අනවශ්‍ය කොටස් කපා හරින්න)

07-491

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ISO 9001 : 2008 තත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2017**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full Time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14යි (පූර්ණ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 21,500

**මයික්‍රොසොෆ්ට් ඔෆීස්** - Microsoft Office

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

කාලයඃ මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල හා ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය** - Computer Graphic Design

ග්‍රැෆික්, මුද්‍රණ සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

**කාලයඃ මාස 04 1/2 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි**

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 16,500 NVQ සහතිකපත් පාඨමාලාව රු. 20,500

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම** - Computer Typesetting and Layout Design

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

කාලයඃ මාස 05යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,500

**වෙබ් අඩවි නිර්මාණය** - Web Designing

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලයඃ මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,500

**ඕෆ්සෙට් ලිතෝකරණය** - Offset Lithography

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත.

කාලය : වසරයි. (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,500

**ත්‍රිමාණ සජීවිකරණය** - Digital Animation

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

කාලය : මාස 06යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,500

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම** - Computer Hardware and Assembly

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබාදෙන අතර එදිනෙද පැනනගින දෘඩාංග/මෘදුකාංගවල අදළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

කාලය : මාස 04යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 12,500

**මුද්‍රණ ක්ෂේත්‍රයට අදළ පිරිවැයකරණය සහ ඇස්තමේන්තුකරණය** - Costing and Estimating for Printers

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Job Costing and Estimating) පිළිබඳ පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ග්‍රැෆික්ස් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

පාඨමාලා කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,500

**පොත් බැඳීම හා නිමාකරණය** - Book Binding and Finishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

කාලය : මාස 07යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 16,500

**ආංකික පෙර මුද්‍රණය** - Digital Prepress

මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැළි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබාගත හැක.

පාඨමාලා කාලය : වසර 1යි (අර්ධ කාලීන) මාධ්‍යඃ සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,500

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 011 2686162, 011 2679791

ෆැක්ස් : 011 2686162ඊ-මේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.

දුරකථන අංක : 066-2222172, 071 0554298.

09-508

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

New Ultra Precision Gap Bed Lathe Machine 01 සැපයීම, ස්ථාපනය සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය - SRS/F.7495

01. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු (මහා පරිමාණ) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් රත්මලාන දුම්රිය වැඩපළ වෙත New Ultra Precision Gap Bed Lathe Machine 01 ක් සැපයීම, ස්ථාපනය සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින් තමන්ගේ ලංසු ඇටෝර්නි බලයක් මගින් බලය පවරන ලද බලයලත් නියෝජිතයකු මගින් ඉදිරිපත් කළ හැකිය.

02. 2017.10.17 වැනි දින ප.ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) ලංසු භාර ගැනීම අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු.2,600.00ක ප්‍රසම්පාදන ගාස්තුවක් හෝ පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකම ගෙවීමෙන් අනතුරුව 2017.10.16 වැනි දින ප.ව.3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය වෙතින් හෝ විදේශීය ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙතින් ලංසු ලිපිලේඛන සමගින් ලබාගත හැකි ආකෘතිවල ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියොජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අනිත් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැක. වැඩිදුර තොරතුරු සඳහා අමතන්න.

| | | |
|---|---|---|
| දුරකථන අංකය | : | 94(11)2438078/ 2436818 |
| ෆැක්ස් අංකය | : | 94(4) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
(මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7495.

09-487

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

දෙමටගොඩ පාලම් ඉංජිනේරු අංශයේ
බහාලුම් (Container) 04ක් විකිණීම - SRS/F.7295

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු (මහා පරිමාණ) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දෙමටගොඩ පාලම් ඉංජිනේරු අංශයේ බහාලුම් (Container) 04ක් විකිණීම සඳහා මුද්‍රා, තබන ලද ලංසු භාර ගනු ලැබේ.

| *විස්තරය* | *ස්ථානය* | *ප්‍රමාණය (දිග x පළල x උස)* |
|---|---|---|
| බහාලුම් 02 ක් | දෙමටගොඩ පාලම් අංගනය | 45' x 8'6" x 9'6" |
| බහාලුම් 02 ක් | දෙමටගොඩ පාලම් අංගනය | 40' x 8'6" x 9'6" |

02. ලංසු භාරගැනීම 2017.09.22 වැනි දින ප.ව. 2.00ට අවසාන කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු.10,000.00ක ලිපි ලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.09.21 වැනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියොජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂාකර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා,

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 2438078/ 2436818 |
| ෆැක්ස් අංකය | : | 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7295

09-488

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ඇණ සහ මුරිච්චි 56,000 ක්, ස්ප්‍රිං වොෂර් 100,000 ක්**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත ප්‍රසම්පාදනය කිරීම**

ප්‍රසම්පාදන අංකය : SRS/F.7532

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු (මහා පරිමාණ) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත ඇණ සහ මුරිච්චි 56,000 ක් සහ ස්ප්‍රිං වොෂර් 100,000 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ලංසුකරුවන් තමන්ගේ ලංසු ඍජුව හෝ ඇටෝර්නි බලයක් විසින් බලය පවරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජියෙකු මාර්ග යෙන්ද ඉදිරිපත් කළ හැකි ය.

02. ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රු. 4,000.00 ක ගාස්තුවක් හෝ ඊට සමාන මුදලක් පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් ගෙවීමෙන් අනතුරුව 2017.10.19 වැනි දින ප.ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) දුම්රිය ගඩබා අධිකාරී කාර්යාලය වෙතින් හෝ එතෙර ශ්‍රී ලංකා තානාපති කාර්යාල වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු යි.

03. ලංසු භාරගැනීම 2017.10.20 වැනි දින ප.ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

04. ඇණ සහ මුරිච්චි නිෂ්පාදනය/ සැපයීම ISO 9001:2008 හෝ ගැණුම්කරුට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකයක් ඇති සමාගම්වලට පමණක් සිදුකළ හැකි ය.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගඩබා අධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසූ විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

06. මුද්‍රා, තබන ලද ලංසූ පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකි ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. දුම්රිය ගඩබා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

| | | |
|---|---|---|
| දුරකතන අංක | : | 2438078 / 2436818 |
| ෆැක්ස් අංකය | : | 2432044 |
| ඊමේල් | : | src.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7532

09-489

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

Curved Switches මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය
(Rail Section EN45 E1 1676 mm - Gauge) - SRS/F. 7507

01. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු (මහා පරිමාණ) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් Curved Switches සැලසුම් නිර්මාණය කොට නිෂ්පාදනය කිරීම සඳහා (Rail Section EN45 E1 for 1676 mm Gauge) විදේශීය නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා, තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් ඇටෝර්නි බලයක් මගින් ඔවුන් විසින් පවරන ලද බලයලත් ඒජන්තවරුන් මගින් ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාරගැනීම 2017.10.13 වැනි දින ප.ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 4,000.00 ක (රුපියල් හාර දහසක) ලිපිලේඛන ගාස්තුවක් හෝ පහසුවෙන් පරිවර්ථනය කළ හැකි මුදල් වර්ගයකින් සමාන මුදලක් ගෙවීමෙන් අනතුරුව 2017.10.12 වැනි දින ප.ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගඩබා අධිකාරි කාර්යාලය වෙතින් හෝ විදේශීය ශ්‍රී ලංකා තනාපති කාර්යාල වෙතින් ලබාගන්නා ආකෘති මත ලංසු ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසූ විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටින මෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා, තබන ලද ලංසූ පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකි ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

06. දුම්රිය ගඩබා අධිකාරි කාර්යාලයේ ලංසූ ලිපි ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර තොරතුරු සඳහා අමතන්න.
දුරකතන අංක : 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකය : 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
(මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,

යොමු අංකය : SRS/F.7507

09-490

---

**සංශෝධිත ප්‍රසම්පාදන දැන්වීම**

ශ්‍රී ලංකා දුම්රිය සේවය

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා සීනුව සහ පහන සහිත දුම්රිය හරස් මාර්ග ආරක්ෂණ පද්ධති 200 සපයා ස්ථාපිත කොට, පරීක්ෂා කොට, ක්‍රියාත්මක කොට නඩත්තු කිරීම සඳහා ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS F. 7410/1

01. 2017.08.18 වැනි දින පළ කරන ලද අංක 2033 ගැසට් පත්‍රයේ 08-544 දැන්වීම් හා බැඳේ.

02. ශ්‍රී ලංකාවේ බත්තරමුල්ල, සෙත්සිරිපාය අදියර 02 හි 7 වන මහලේ, සිවිල් හා ගුවන් සේවා අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ලංසු නිකුත් කරන අවසාන දිනය ලංසු වැසීම හා විවෘත කරන දිනය පහත දැක්වෙන අයුරින් දීර්ඝ කොට ඇත.

ලංසු ලිපි ලේඛන නිකුත් කරන අවසාන දිනය : 2017.09.27
ලංසු වැසීම/විවෘත කිරීම සිදුකරන දිනය : 2017.09.28

03. වැඩි මනත් විස්තර ලබාගැනීම සඳහා විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10.

දුරකථන අංක : 94(11) 2438078/2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
විද්‍යුත් තැපෑල : srs.slr@gmail.com
යොමු අංකය : SRS/F. 7410/1

සභාපති,
අමාත්‍ය මණ්ඩලය පත්කළ.
ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

09-587

# බඩු බාහිරාදිය විකිණීම්

### මහෙස්ත්‍රාත් අධිකරණය - බද්දේගම

මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ, නඩු කටයුතු අවසන් කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ සහ බඩු වට්ටෝරු පොතේ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශය මත ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. බද්දේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාලව අධිකරණයට ඉදිරිපත් කරනු ලදුව නඩු කටයුතු අවසන් කරන ලද, රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ සහ භාණ්ඩ සමීක්ෂණයේදී නිර්දේශ මත ඉවත් කරන ලද පහත සඳහන් භාණ්ඩ 2017.10.14 වැනි දින පෙ.ව. 09.30 ට බද්දේගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවල හිමිකම් දක්වන්නෙකුවේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිලි මඟින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට (1/2) කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය මඟින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළු ගෙවීම් මුදලින් පමණක් කළ යුතුවේ.

6. ගැණුම්කරුවන් විසින් තම අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එච්. අයි. කේ. කාහිංගල,
දිසා විනිසුරු - මහෙස්ත්‍රාත්.

2017 අගෝස්තු මස 30 වැනි දින,
බද්දේගම දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### නඩු භාණ්ඩ වෙන්දේසිය - 2017

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ඒආර් 116/12 | වක් පිහි | 01 යි |
| 02 | 65113 | පිහි | 01 යි |
| 03 | 49930 | වක් පිහි | 01 යි |
| 04 | 47334 | පිහි | 01 යි |
| 05 | 68176 | වක් පිහි | 01 යි |
| 06 | 65157 | වක් පිහි | 01 යි |
| 07 | 71643 | වක් පිහි | 01 යි |
| 08 | 40962 | වක් පිහි | 01 යි |
| 09 | 80743 | සුදුපැහැති පිහි | 01 යි |
| 10 | 70081 | කුඩා පිහි | 01 යි |
| 11 | 52638 | මන්නා පිහි | 01 යි |
| 12 | 61148 | වක් පිහි | 01 යි |
| 13 | 67619 | වක් පිහි | 01 යි |
| 14 | 95091 | පිහි | 01 යි |
| 15 | 41126 | පිහි | 01 යි |
| 16 | 59831 | වක් පිහි | 01 යි |
| | | ජංගම දුරකථන | 01 යි |
| | | විදුලි පන්දම් | 01 යි |
| 17 | 49536 | වක් පිහි | 01 යි |
| 18 | 51009 | කැති | 01 යි |
| 19 | 49793 | වක් පිහි | 01 යි |
| 20 | 93464 | කැති | 01 යි |
| 21 | 70034 | කැති | 01 යි |
| 22 | 61180 | පොරව | 01 යි |
| 23 | 64587 | අත් පොරව | 01 යි |
| 24 | 59799 | ප්ලාස්ටික් බාල්දි | 01 යි |
| 25 | 66344 | යකඩ බාල්දි | 01 යි |
| 26 | 56937 | යකඩ බාල්දි | 01 යි |
| 27 | 94907 | යකඩ බාල්දි | 01 යි |
| 28 | 52833 | යකඩ බාල්දි | 01 යි |
| 29 | 54066 | යකඩ බාල්දි | 01 යි |
| 30 | 53673 | යකඩ බාල්දි | 01 යි |
| 31 | 62122 | යකඩ බාල්දි | 01 යි |
| 32 | 56180 | යකඩ බාල්දි | 01 යි |
| 33 | අංක රහිත | පැදුරු | 01 යි |
| 34 | අංක රහිත | වීදුරු බෝතල් | තොගයක් |
| 35 | අංක රහිත | යකඩ බැරල් | තොගයක් |
| 36 | අංක රහිත | බූලි | තොගයක් |
| 37 | අංක රහිත | දිරාගිය දුව කඳන් (දර සඳහා) | තොගයක් |
| 38 | අංක රහිත | කළ ගෙඩි | 02 යි |
| 39 | 94340 | ඇලුමිනියම් මුට්ටි | 01 යි |
| | | සාස්පාන් | 01 යි |
| 40 | 58956 | වේවැල් කූඩ | 01 යි |
| | | යකඩ බාල්දි | 01 යි |
| 41 | 41835 | යකඩ බාල්දි | 01 යි |
| | | සවල් | 01 යි |
| 42 | 65150 | බාල්දි | 01 යි |
| | | සවල් | 01 යි |
| 43 | 65149 | යකඩ බාල්දි | 01 යි |
| | | සවල් | 01 යි |
| 44 | 66490 | යකඩ බාල්දි | 01 යි |
| | | සවල් | 01 යි |
| 45 | 62118 | යකඩ බාල්දි | 01 යි |
| | | සවල් | 01 යි |
| 46 | 82553 | යකඩ බාල්දි | 01 යි |
| | | සවල් | |
| 47 | 94829 | යකඩ බාල්දි | 01 යි |
| | | සවල් | |
| 48 | 93705 | සවල් | 01 යි |
| 49 | 56947 | සවල් | 01 යි |
| | | උදලු | |
| 50 | 74540 | උදලු | 01 යි |
| 51 | 69131 | උදලු | 01 යි |
| 52 | 91847 | උදලු | 02 යි |
| 53 | 82455 | උදලු | 01 යි |
| 54 | 63984 | උදලු | 01 යි |
| 55 | 76192 | උදලු | 01 යි |
| 56 | 76193 | උදලු | 01 යි |
| 57 | 68881 | උදලු තල | 01 යි |
| 58 | 78979 | උදලු | 01 යි |
| 59 | 82554 | උදලු | 01 යි |
| | | කූඩ | 01 යි |
| 60 | 92080 | උදලු | 01 යි |
| | | සවල් | 01 යි |
| | | අලවංගු | 01 යි |
| 61 | ඒආර් 802/17 | උදලු | 01 යි |
| | | අලවංගු | 01 යි |
| | | සවල් | 01 යි |
| 62 | 53702 | මිට කැඩීගිය උදලු | 01 යි |
| 63 | 66650 | අත් කියත් | 01 යි |
| 64 | 65281 | නියන් | 01 යි |
| | | අතකොලු | 01 යි |
| 65 | 56513 | නියන් | 01 යි |
| 66 | 72898 | අඬු | 02 යි |
| | | නියන් | 01 යි |
| 67 | 67836 | කඹ | 01 යි |
| | | ස්කුරුප්පු නියන් | 01 යි |
| 68 | 65457 | විසි කැති | 01 යි |
| 69 | 69466 | මිටි | 01 යි |
| 70 | 89186 | යකඩ බට කැලි | 01 යි |
| 71 | 65397 | යකඩ කූරු | 01 යි |
| 72 | 74135 | අඟල් 05 ක් පමණ දිග රවුම් යකඩ කැබලි | 01 යි |
| 73 | 74108 | යකඩ පොලු | 01 යි |
| 74 | 60078 | ගැල්වර් නයිස් බට කැබලි | 01 යි |
| 75 | 68992 | ගැස්වර් නයිස් බට කැබලි | 01 යි |
| 76 | 65480 | අලවංගු | 01 යි |
| 77 | 89713 | කොණ්ඩෙ කපන කතුරු | 01 යි |
| 78 | 64569 | වේවැල් කූඩ | 01 යි |
| 79 | 63610 | වේවැල් කූඩ | 01 යි |
| 80 | 63611 | වේවැල් කූඩ | 01 යි |
| 81 | 69810 | තරාදි කදන් | 01 යි |
| 82 | 94838 | ඉලෙක්ට්‍රොනික් තරාදි | 01 යි |
| 83 | 93610 | 100 kg දුනු තරාදි | 01 යි |
| 84 | 73608 | 100 kg දුනු තරාදි | 01 යි |
| 85 | 73603 | පඩි තරාදි | 01 යි |
| 86 | අංක රහිත | පඩි තරාදි | 01 යි |
| 87 | 72265 | පඩි තරාදි | 01 යි |
| 88 | 48627 | ආරක්ෂිත හිස්වැසුම් | 01 යි |
| 89 | 89763 | ආරක්ෂිත හිස්වැසුම් | 01 යි |
| 90 | අංක රහිත | වල්කුරුදු මිටි | 03 යි |
| 91 | 51334 | රබර් කිරි කපන පිහි | 01 යි |
| 92 | 62117 | රබර් කිරි කපන | 01 යි |
| | | පිහි ඔට්ටපාලු | 02kg යි |
| | | ඔට්ටපාලු අඩංගු 4 L කෑන් | 01 යි |
| 93 | 56858 | ඔට්ටපාලු | 4 kg |
| 94 | අංක රහිත | ඔට්ටපාලු | තොගයක් |
| 95 | 69465 | තඹ අඩංගු පාර්සල් | 01 යි |
| 96 | අංක රහිත | තඹ දඟර (තලන ලද) | තොගයක් |
| 97 | අංක රහිත | වයර් | තොගයක් |
| 98 | අංක රහිත | කම්බි | තොගයක් |
| 99 | අංක රහිත | අත්ට්‍රැක්ටර් බෙල්ට් | කිහිපයක් |
| 100 | අංක රහිත | පොහොර | හොන්ඩරයක් |
| 101 | 57940 | සිංගර් වර්ගයේ මහන මැෂින් කොටස් අඩංගු පොහොර උර | 01 යි |
| 102 | 57478 | සිංගර් වර්ගයේ අඟල් 14 කළු, සුදු TV | 01 යි |
| | | ආරක්ෂිත හිස් වැසුම් | 02 යි |
| 103 | 55982 | ජෝ පලු | 02 යි |
| | | මෝටරයක කොටස් අඩංගු පොහොර උර | 01 යි |
| 104 | 56077 | ග්‍රීස් විදින උපකරණ | 01 යි |
| 105 | 69759 | ඩ්‍රිල් යන්ත්‍ර | 01 යි |
| 106 | 94690 | මාලුටැංකි සඳහා භාවිතා කරනු ලබන ඔක්සිජන් මෝටර් | 01 යි |
| 107 | අංක රහිත | විදුලියෙන් ආරෝපනය කල හැකි විදුලි පන්දම් | 01 යි |
| 108 | 95108 | යකඩ ගෑස් ලිප් | 01 යි |
| 109 | 93768 | ලිට්‍රෝ වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 යි |
| | | ගෑස් ලිප් | 01 යි |
| 110 | 94261 | ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 යි |
| | | ගෑස් ලිප් | 01 යි |
| 111 | 94889 | ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් | 01 යි |
| | | ගෑස් ලිප් | 01 යි |
| 112 | 94979 | ලාෆ් වර්ගයේ ගෑස් සිලින්ඩරය | 01 යි |
| | | ගෑස් ලිප් | 01 යි |
| 113 | 84934 | ලියාපදිංචි අංක රහිත අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 යි |
| 114 | 90677 | අංක SPGA 4846 දරන ටේලරය සහිත අත්ට්‍රැක්ටර් | 01 යි |
| 115 | අංක රහිත | අංක 128-8390 දරන වර්ගය ඇපැහැදිලි යතුරුපැදි | 01 යි |
| 116 | ඒආර් 2898/15 | අංක SPGN 3894 දරන බජාජ් බොක්සර් යතුරුපැදි | 01 යි |
| 117 | ඒආර් 860/16 | ලි.ප. අංක SPJS 9989 දරන බජාජ් පල්සර් යතුරු පැදි | 01 යි |
| 118 | ඒආර් 853/16 | ලි.ප. අංක රහිත බජාජ් ප්ලැටිනා යතුරු පැදි | 01 යි |
| 119 | 90702 | අංක හා වර්ගය අපැහැදිලි අත්ට්‍රැක්ටර් එන්ජිම (යාන්ත්‍රික කොටස පමණි) | 01 යි |

### 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් වෙන්දේසියට නියම කර ඇති භාණ්ඩ

| | | |
|---|---|---|
| 01. | ඔරලෝසු | 01 යි |
| 02. | ඇඳි සහිත පුටු | 05 යි |
| 03. | යතුරු ලියන පුටු | 02 යි |
| 04. | යතුරු ලියන | 02 යි |

09-425

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද නැවත විකිණීම

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017/2018 වර්ෂය

**(2017 ඔක්තෝබර් මස 15 වැනි දින සිට 2018 ජුනි මස 30 වැනි දින දක්වා)**

2017 ඔක්තෝබර් මස 15 වැනි දින සිට 2018 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයකම ත්‍රිකුණාමලය දිසාපති/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලින් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ "අංක.................................. දරන........................................ රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය යනුවෙන්" උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2017.10.09 වැනි දින පෙ.ව. 10.00 ට පෙර ත්‍රිකුණාමලය දිසාපති/දිස්ත්‍රික් ලේකම්ට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ත්‍රිකුණාමලය දිසාපති/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2017.10.09 වැනි දින ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ප්‍රසම්පාදනකරුවන් ත්‍රිකුණාමලය දිසාපති/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත් අතුරින් තෝරා ගනු ලබන සාර්ථකම ගැනුම්කරු විසින් මාස 03 ක තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනම ගෙවිය යුතු ය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් 2017.10.09 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා 2017 ඔක්තෝබර් මස 16 වැනි දින පෙ. ව. 10.00 දක්වා ප්‍රසම්පාදන පත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාරගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියලු කොන්දේසි අදාළ වන බව ද සැලකිය යුතු ය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ත්‍රිකුණාමලය දිසාපති/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

එන්. ඒ. ඒ. පුෂ්පකුමාර,
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්,
ත්‍රිකුණාමලය.

2017 සැප්තැම්බර් මස 13 වැනි දින,
ත්‍රිකුණාමලය දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | කොට්ඨාසය | ප්‍රාදේශීය පළාත | විවෘත කරන වේලාව | වසන වේලාව | ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු. | ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| 01 | කො. අංක 01 | විල්ලූන්ඩි අංක 01 | පෙ.ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8. 00 | 3,000 | 1,000 |
| 03. | කට්ටුකුලම්පත්තු | නිලාවේලි අංක 04 | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 1,500 | 1,000 |

09-793

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩී එච් පී හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : PV 124077
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 714/3, ගැමුණු මාවත, හෝමාගම.
ලියාපදිංචි දිනය : 2017.07.21

ඒ. ජේ. එම්. සමන්ත ජයසුන්දර
සමාගම් ලේකම්.

09-432

---

## නෝවෝ නෝර්ඩිස්ක් ලංකා (පීවීටී) එල්ටීඩී

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම සම්බන්ධ ප්‍රසිද්ධ දැන්වීමයි

නෝවෝ නෝර්ඩිස්ක් ලංකා (පීවීටී) එල්ටීඩී 2017 අගෝස්තු මස 28 වැනි දින සීමාසහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමු. සමාගමේ ලියාපදිංචි අංකය PV 124772 වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය අංක 116/10, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.

සෙන්ට්‍රල් කෝපරේට් ඇන්ඩ් කන්සල්ටන්සි
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගම් ලේකම්වරු)
අංක 116/10, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.

09-454

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

සමාගම් නාමය වෙනස් කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : රිජන්සි ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 4656
ලියාපදිංචි කාර්යාල ලිපිනය: අංක 146, ඩෝසන් වීදිය, කොළඹ 02.
සමාගමේ නව නාමය: ෆොක්ස් වැකේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් 2017.08.29 දින සිට වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක/සමාගම් ලේකම්.

09-455

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය අනුව, පහත සඳහන් සීමිත සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සෙවන් බ්‍රදර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 123991
ලියාපදිංචි කළ දිනය : 2017 ජූලි මස 18 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 49, ජයන්ති මාවත,
තිඹිරිකඩවල, අනුරාධපුර.

නීතිඥ එච්. එම්. සරත් විජයරත්න,
සමාගමේ ලේකම්.

09-456

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

වැලිගම, දෙණිපිටිය, අලුත්ගෙදරවත්ත, අංක 119/ඒ දරන ස්ථානයෙහි පදිංචි අංක 831740604 V දරන ජාතික හැඳුනුම්පත හිමි සමරසිංහ කාංකානම්ගේ කසුන් වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. ආනන්ද කුමාර මහතා විසින් සහතික කරන ලද අංක 535 දරන 2014.03.25 දිනැති ඇටෝර්නි බලපත්‍රය මත වැලිගම, දෙණිපිටිය, අලුත්ගෙදරවත්ත, අංක 119/ඒ දරන ස්ථානයෙහි පදිංචි ජඹුරෙගෙ ාඩ ගමගේ ඉර්ෂා ලක්මාලි යන අය වෙත, මා සම්බන්ධයෙන් කටයුතු කිරීමට පවරා දුන් ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිනු ලැබේ.

මෙතැන් පටන් මා සඳහා හෝ මා වෙනුවෙන් ඉහත කී ජඹුරෙගොඩ ගමගේ ඉර්ෂා ලක්මාලි නැමැති අය විසින් සිදු කරනු ලබන්නා වූ කිසිඳු දෙයක් සම්බනධයෙන් වගකීම මා විසින් භාරගනු නොලබන බව ද දන්වා සිටිමි.

සමරසිංහ කාංකානම්ගේ කසුන්.
2017 සැප්තැම්බර් මස 04 වැනි දින,
අංක 68, ගැමුණු මාවත,
තිබ්බොටුගොඩ,
ගනේමුල්ල.

09-457

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 අගෝස්තු මස 22 වැනි දින සංස්ථාගත කරන ලදී.

නම : රෙනේසන්ස් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී. වී. 124922
ලිපිනය : අංක 32, වට මාවත, නාවින්න, මහරගම.

එන්. ඩී. හපුආරච්චි,
සමාගමේ ලේකම්.

09-472

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

මහනුවර හීරස්සගල පාර, අංක 154 හි පදිංචි ජා. හැ. 681390243 V සේනාධීර පතිරන්නැහේලාගේ සුනිල් ශාන්ත වන මා විසින් පිට්ටෑගම ගම්ලත් රාලලාගෙ පුලස්ති බුද්ධික ගම්ලත් ඇටෝර්නි බලකරු ලෙස පත්කරමින් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. මානෙල් ගජනායක මහත්මිය විසින් සකස් කළ 159 වර්ෂ 2017 වූ මැයි මස 30 සකස් කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙතැන් සිට අවලංගු වන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතතාවටත් මෙයින් දැනුම් දෙමි.

09-458

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ 209/බී, දෙල්ගමුව, කුරුවිට ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 590761729 V දරන නම්බිගේ දොන් සේනාරත්න ධම්මික ප්‍රියන්ත වන ම විසින් කුරුවිට, දෙල්ගමුව පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 846433058 V හිමි සුප්පයියා ලක්කී කොලෙක්ෂනී යන අය මගේ ඇටෝර්නි බලකරු ලෙස නම් කරමින් 2010 සැප්තැම්බර් මස 03 වැනි දින රත්නපුර නව නගරයේ අංක 600 දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ නොතාරිස් ආලෝකා අනුර ජයසුන්දර මහතා ලවා ලියා සහතික කොට ඌව සබරගමුව කලාප ජනරාල් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1163 යටතේ ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2017 අගෝස්තු මස 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තව ද, මෙතැනින් පසු එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් ඇටෝර්නි බලකරු විසින් සිදු කරනු ලබන කිසිදු කටයුත්තකට වග නොකියන බවට, වැඩි දුරටත් සඳහන් කරමි.

මෙයට,
නම්බිගේ දොන් සේනාරත්න ධම්මික ප්‍රියන්ත.
2017 අගෝස්තු මස 22 වැනි දින.

09-500

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ 209/බී, දෙල්ගමුව, කුරුවිට ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 705561958 X දරන නම්බිගේ දොන් සේනාරත්න ශෝබා ශීරෝනී වන ම විසින් කුරුවිට, දෙල්ගමුව පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 846433058 V හිමි සුප්පයියා ලක්කී කොලෙක්ෂනී යන අය මගේ ඇටෝර්නි බලකරු ලෙස නම් කරමින් 2010 සැප්තැම්බර් මස 03 වැනි දින රත්නපුර නව නගරයේ අංක 600 දරන ස්ථානයේ දී ප්‍රසිද්ධ නොතාරිස් ආලෝකා අනුර ජයසුන්දර මහතා ලවා ලියා සහතික කොට ඌව සබරගමුව කලාප ජනරාල් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 1163 යටතේ ලියාපදිංචි කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2017 අගෝස්තු මස 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තව ද, මෙතැනින් පසු එකී ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් ඇටෝර්නි බලකරු විසින් සිදු කරනු ලබන කිසිදු කටයුත්තකට වග නොකියන බවට, වැඩි දුරටත් සඳහන් කරමි.

මෙයට,
නම්බිගේ දොන් සේනාරත්න ශෝබා ශීරෝනී.

2017 අගෝස්තු මස 22 වැනි දින.

09-501

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව මෙයින් දන්වා සිටින වග නම්

සමාගමේ නම : එකියුම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 124708
ලියාපදිංචි කළ දිනය : 2017 අගෝස්තු මස 23 වැනිද
ලියාපදිංචි කාර්යාලය : අංක 97ඒ, ගාලු පාර, කොළඹ 03.

අධ්‍යක්ෂ.

09-502

---

## දැන්වීමයි

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥා පනතේ 9 (1) ඡේදය අනුව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමු.

(1) වෙළඳ සමාගමේ නම : එලික්සීර් පරෙස්ඩ් ජූසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 123740
ලියාපදිංචි කළ දිනය : 2017 ජූලි 12
ලියාපදිංචි කාර්යාලය : අංක 79, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7

(2) වෙළඳ සමාගමේ නම : එස් ඇන්ඩ් ඕර්ගනික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 124405
ලියාපදිංචි කළ දිනය : 2017 අගෝස්තු මස 08
ලියාපදිංචි කාර්යාලය : 79, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7

(3) වෙළඳ සමාගමේ නම : ට්‍රබේයා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 124983
ලියාපදිංචි කළ දිනය : 2017 අගෝස්තු 24
ලියාපදිංචි කාර්යාලය : 9/1, පල්ලිය පාර, දෙහිවල.

එන් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

09-503

---

## ට්‍රයි - ස්ටාර් ඇපරල් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීවී 8731

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඈවරකරුගේ පත්වීමේ දැන්වීම

සමාගමේ නම : ට්‍රයි - ස්ටාර් ඇපරල් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30, මාලිගාව පාර, රත්මලාන
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 52/2016 CO
ඈවරකරුගේ නම : ජී ජේ ඩේවිඩ්
ලිපිනය : ඈවරකරු
SJMS ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්
3 වන මහල, අංක 11, කාසල් පටුමග,
කොළඹ 04
පත්වීමේ දිනය : 2017 අගෝස්තු 11.

09-504/1

---

## ට්‍රයි - ස්ටාර් ඇපරල් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය පීවී 8731

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (ඉ) සහ (ඊ) වගන්තිය යටතේ පරිවෘත කිරීමේ නියෝගය

සමාගමේ නම : ට්‍රයි - ස්ටාර් ඇපරල් එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 30, මාලිගාව පාර, රත්මලාන
උසාවිය : බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය, (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (CIVIL) 52/2016 /CO
නියෝගය දුන් දිනය : 2017 අගෝස්තු 11
පෙත්සම ඉදිරිපත්කළ දිනය : 2016 සැප්තැම්බර් 22
ඈවරකරුගේ නම : ජී ජේ ඩේවිඩ්
ලිපිනය : ඈවරකරු
SJMS ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්
3 වන මහල, අංක 11, කාසල් පටුමග,
කොළඹ 04

09-504/2

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බැවින් මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : ගනිෂ්ක වික්‍රමපාල හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 124261
ලියාපදිංචි ලිපිනය : අංක 28/1, රොඩ්රිගෝ අවනියු, ගල්පොත්ත පාර, නාවල.

සමාගමේ නම : ප්‍රයිම් කැපිටල් රිසෝර්සස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 124542
ලියාපදිංචි ලිපිනය : අංක 18 1/4, කොලිංවුඩ් ප්ලෙස්, වෙල්ලවත්ත, කොළඹ 06

සමාගමේ නම : ජී ඩී ඇග්‍රෝ ෆූඩ්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 123817
ලියාපදිංචි ලිපිනය : අංක 19, ප්‍රධාන වීදිය, (දුර්ගා සහල් මෝල අසල)
කන්චිරන්කුද, තිරුකෝවිල්, අම්පාර.
සමාගමේ නම : සිනර්ජි ස්කිල්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 125086
ලියාපදිංචි ලිපිනය : අංක 910/1, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපර්රේට් ඩී සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

09-506

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය නම වෙනස් කර ඇතිබැවින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සමර් වික්ටරි (පුද්ගලික) සමාගම
සමාගමේ අලුත් නම : ඉන්ටර්නැෂනල් පොලිටෙක්නික් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 115876
ලියාපදිංචි ලිපිනය : අංක 10, වින්සන්ට් ජොසප් මාවත, වත්තල

සමාගමේ නම : අයි ඊ සී ඩිවලොප්මෙන්ට් (පුද්ගලික) සමාගම
සමාගමේ අලුත් නම : සී එන් ඊ සී ඩිවලොප්මෙන්ට් ඉන්ජිනියරිං ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 98327
ලියාපදිංචි ලිපිනය : අංක 513, ඉහළ මට්ටමේ මාර්ගල, ගංගොඩවිල, නුගේගොඩ, කොළඹ

සමාගමේ නම : අප්ටබාස් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අලුත් නම : සුසිටික් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 88423
ලියාපදිංචි ලිපිනය : 2 වන තට්ටුව, අංක 275, නෙලුම් බිල්ඩිං, නාවල පාර, නාවල.

සමාගමේ නම : ශ්‍රී වාස්තු බිල්ඩිං කන්ස්ට්‍රක්ෂන් (පුද්ගලික) සමාගම
සමාගමේ අලුත් නම : ශ්‍රී වාස්තු බිල්ඩර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 71643
ලියාපදිංචි ලිපිනය : 46/12, වෙලිකඩවත්ත පාර, නාවල පාර, රාජගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

කෝපර්රේට් ඩී සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

09-507

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දෙවිනුවර පියරතන පාර, ''ශ්‍රී කාන්ත'' දරන ස්ථානයේ පදිංචි ගයා ආදරී රන්පටබැඳිගේ වන මම දෙවිනුවර, පියරත්න පාර, ''ශ්‍රී කාන්ත'' හි පදිංචි අරුණා වනදිනි විජේසේකර යන අයට මාතර ප්‍රසිද්ධ නොතාරිස් මෙත්නි සිරිවර්ධන මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 88 සහ 1997 ජූලි මස 30 වැනි දින දරන කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇටෝර්නි බලපත්‍ර පොතේ 178 කාණ්ඩයේ 185 පත් ඉරුවේ 5538 දිනපොතේ අංකය යටතේ ලියාපදිංචි වී ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර බලරහිත කරමි.

මෙම දිනයෙන් පසුව එකී අරුණා වනදිනි විජේසේකර යන අය එම විශේෂ ඇටෝර්නි බලපත්‍රයට අදාළව කරන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ජනරජයට හා මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ගයා ආදරී රන්පටබැඳිගේ.
2017 සැප්තැම්බර් මස 11 වැනි දින.

09-534

### මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පෞද්ගලික සමාගම 2017 අගෝස්තු මස 14 වැනි ද පිහිටුවන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ඔන්ලයින් ටැක්ස් ඇඩ්වයිසර් පෞද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 124651
ලියාපදිංචි කාර්යාලය : අංක 26ඒ/15ඒ, ගැමුණු මාවත, අත්තිඩිය, දෙහිවල.

සමාගම් ලේකම්.

09-537

---

### මහජනතාව වෙත දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පෞද්ගලික සමාගම 2017 අගෝස්තු මස 04 වැනි ද පිහිටුවන ලද බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : රන්ලාක් පෞද්ගලික සමාගම
සමාගමේ අංකය : පී වී 124471
ලියාපදිංචි කාර්යාලය : අංක 194/ඩී, පොල්ගහඅංග, වැලිගල්ල.

සමාගම් ලේකම්.

09-538

---

### විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 1 සී, වෙදමාවත, වට්ටපොල, පානදුර පදිංචි අල්ලාපිච්චී මරික්කාර් සබීක් වන මම මන්නාරම ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් සෙබමාලායි ජේබනේෂන් ලෝගු විසින් සහතික කරන ලද 2007 නොවැම්බර් මස 19 දින හා අංක 0564 දරන, මා විසින් මන්නාරම උප්පුක්කුලම් පදිංචි සේගු ඉබ්‍රාහිම් මෝහමඩ් රාෆීක් වෙත පවරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කර අහෝසිකරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අල්ලාපිච්චී මරික්කාර් සබීක්.

09-552

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : මෝටර් ලින්ක් හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 21, ලූෂන් සිල්වා මාවත, ලුනාව, මොරටුව.
සමාගම් අංකය : පී වී 121977
සංස්ථාගත කළ දිනය : 2017.05.02

කාටර් ද කොස්තා කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

09-553

---

### දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙහිවල, කව්ඩාන බ්‍රෝඩ්වේ හි අංක 37 හි පදිංචි ඉදිපොලගේ පුණ්‍යසිරි කාරියවසම් වන මා විසින්, කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ටී. ජේ. කාරියවසම් මහතා විසින් 1987 පෙබරවාරි 09 වන දින ලියා සහතික කරන ලද දෙහිවල, කව්ඩාන බ්‍රෝඩ්වේ හි අංක 37 පදිංචි ඉදිපොලගේ ඕවන් විජේසිරි කාරියවසම් වන මාගේ සහෝදරයා වෙත පවරන ලද අංක 483, දරන ඇටර්නි බලපත්‍රය (සිදු කළ යුතු කාර්යයන් සම්පූර්ණයෙන් එම ඇටර්නි බලපත්‍රයෙහි විස්තර කොට ඇත) ප්‍රත්‍යාදිෂ්ට කොට අවලංගු කළ බව සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙයින් දන්වා සිටිමි.

අයි. පී. කාරියවසම්.

2017 ජූලි 06 වැනි දින,
දෙහිවල දී.

09-520

1. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ (නමුත් පානදුර ලියාපදිංචි කොට්ඨාසය තුළ) පානදුර තොටමුණ තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කෙසෙල්වත්ත උප කාර්යාලයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තල්පොල අංක 674A ග්‍රාම නිලධාරී වසමේ වත්තල්පොලහි පිහිටි ජය මාවතේ වරිපනම් අංක 36/1 දරන අඹගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එස්. පෙරේරා විසින් 1980 ඔක්තෝබර් 18 වැනි දින පිළියෙල කරන ලද අංක 599 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ඉඩම් විශාලත්වයෙන් පර්චස් නවයයි දශම තුනයි පහ (අ:0, රූ:0, පර්:9.35) ක් වූ බිම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියළුම දේද වේ.

2. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ (නමුත් පානදුර ලියාපදිංචි කොට්ඨාසය තුළ) පානදුර තොටමුණ තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ කෙසෙල්වත්ත උප කාර්යාලයේ පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වත්තල්පොල අංක 674A ග්‍රාම නිලධාරි වසමේ වත්තල්පොලහි පිහිටි ජය මාවතේ වරිපනම් අංක 36/2 දරන තුක්කිනියාවත්ත ඒ කොටස නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ආර්. බී. සිල්වා විසින් 1963 දෙසැම්බර් 22 වැනි දින පිළියෙල කරන ලද අංක 1354 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ඉඩම් විශාලත්වයෙන් පර්චස් හයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 6.5) ක් වූ බිම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියළුම දේද වේ.

දේපළට පිවිසීම.- මොරටුව වාණිජ නගරය පසුකර පරණ ගාලු පාර දිගේ බොල්ගොඩ නදිය හරහා ඇති පරණ පාලම පසුකර නැවත එම පාරේ කෙසෙල්වත්ත හන්දිය ද පසුකර පල්ලිමුල්ල හන්දියට පැමිණි විට එතැනින් වමට හැරී වත්තල්පොල පාර දිගේ පැමිණ නැවතත් වමට හැරී තොටවත්ත පාර දක්වා පැමිණ එතැනින් ශ්‍රී සද්ධරමරාජ පාර ඔස්සේ ජය මාවත දක්වා පැමිණ එතැනින් කෙටි දුරක් ගමන් කළ පසු විෂයානුබද්ධ 1 වන උපලේඛනයේ සඳහන් දේපළ වම්පසින් පිහිටා ඇති අතර, ඒ ආසන්නයේම 2 වැනි උපලේඛනයේ සඳහන් දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා.- 2017.06.16 වැනි දින 'ඩේලි මිරර්' හා 'ලක්බිම' සහ 'තිනකුරල්' පුවත්පත් බලන්න. එමෙන්ම වෙන්දේසි දැන්වීම සඳහා 2017.06.09 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(i) ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
(ii) පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ද,
(iii) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ද,
(iv) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
(v) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 500.00 ක් ද,
(vi) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.00 ක් ද වේ.

තවද, ගැනුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. තවද දින තිහක් (30) ක් ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී බැංකුවට අයිතිය ඇත.

පහත සඳහන් අයගෙන් ඔප්පු පත්ඉරු සහ අදාල අනෙකුත් දේ ලබාගත හැක. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - වාණිජ අයකර ගැනීම්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, එච්. එන්. බී. ටවර්ස්, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661833, 2661826, 2661836

කේ. පී. එන්. සිල්වා, (සා.වි.)
උසාවි කොමසාරිස්,
රාජ්‍ය හා වානිජ බැංකු පිළිගත් ජ්‍යෙෂ්ඨ
වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

'ඉන්ටස්ටේට් ඔක්ෂන්ස්'
අංක: 109/12 ඒ, ගෝතමී පාර, බොරැල්ල, කොළඹ 08.
දුරකතන/ ෆැක්ස් අංක : 011-2674626,
ජංගම : 077-1006829, 077-1316829
e-mail: premalalnsilva@gmail.com

09-607/1

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පංචිකාවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන, අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූද, 2010 සැප්තැම්බර් මස 21 දින සහතික කළ අංක 6181 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුවන්ද ආරච්චිගේ සනත් කුමාර යන අය විසින් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත මුදල් ගෙවීම හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ, 2017 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ මොරටුවහි පිහිටි උයන පාරේ වරිපනම් අංක 31 දරන පයාරුගහවත්ත හෙවත් වැටකෙයියාගහවත්ත සහ කොටසක් වන මාදංගහවත්ත සහ පළුවීරගහවත්ත රෝස්බැන්ක් ලෙස හඳුන්වන නැමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් 1995 පෙබරවාරි 10 වැනි දින අතුරු කොටසින් සාදන ලද අංක 1010 දරන පිඹුරේ ලොට් 1) බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් 1995 අප්‍රේල් මස 08 වැනි දින පිළියෙල කරන ලද අංක 1026 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 10 දරන ඉඩම් කොටසට අංක 1026 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම හයයි බින්දුව (අ:0, රූ:0, පර්:12.60) ක් විශාලත්වයෙන් යුක්ත වේ.

ඉහත කී අංක : 1026 දරන පිඹුරේ දක්වා ඇති ලොට් : 14 (මීටර් 6 ක් පළල පාරක් සදහයා වෙන්කරන ලද බිම් කොටස මතින් මාර්ග අයිතීයද සමඟ වේ.)

දේපළට පිවිසීම. - දෙහිවල මංසන්දියේ සිට ගාළු පාර ඔස්සේ මොරටුව කුරුස හන්දිය දක්වා පැමිණ දකුණට හැරී මීටර් 200 ක් පමණ ශාන්ත ජෝශප් වීදියේ ක්‍රිස්තියානි පල්ලිය දක්වා පැමිණ එතැනින් නැවත වරක් දකුණට හැරී මීටර් 200 ක් පමණ ඉදිරියට උයන පාර දිගේ එතැනින් තාර පාර දක්වා පැමිණ එතැනින් වමට හැරී මීටර් 20 ක් පමණ ඇතුළත තාර පාර දිගේ පැමිණි පසු එකී දේපළට ළඟාවිය හැකි අතර, එය දකුණු පස පිහිටා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා : 2017.06.16 වැනි දින 'ඩේලි මීරර්' හා 'ලක්බිම' සහ 'තිනකුරල්' පුවත්පත් බලන්න. එමෙන්ම වෙන්දේසි දැන්වීම සඳහා 217.06.09 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(i) ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
(ii) පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ද,
(iii) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ද,
(iv) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
(v) ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 500.00 ක් ද,
(vi) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.00 ක් ද වේ.

තවද, ගැනුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) ක් ඇතුළත හැටන් නැෂනල් බෑනක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. තවද දින තිහක් (30) ක් ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපළ නැවත විකිණීමට හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී බැංකුවට අයිතිය ඇත.

පහත සඳහන් අයගෙන් ඔප්පු පත්‍රිරු සහ අදාළ අනෙකුත් දේ ලබාගත හැක. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - වාණිජ අයකර ගැනීම්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, එච්. එන්. බී. ටවර්ස්, අංක: 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 2661833, 2661826, 2661836.

කේ. පී. එන්. සිල්වා, (සා.වි.)
උසාවි කොමසාරිස්, රාජ්‍ය හා වානිජ
බැංකු පිළිගත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු
සහ තක්සේරුකරු.

'ඉන්ටස්ටේට් ඔක්ෂන්ස්'
අංක: 109/12 ඒ, ගෝතමී පාර, බෙරුල්ල, කොළඹ 08.
දුරකතන/ ෆැක්ස් : 011-2674626,
ජංගම : 077-1006829, 077-1316829
e-mail: premalalnsilva@gmail.com

09-607/2

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පංචිකාවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන, අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. සිරිවර්ධන විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද, 2014 නොවැම්බර් මස 14 වැනි දින සහතික කළ අංක 4974 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුවන්ද ආරච්චිගේ සනත් කුමාර යන අය විසින් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත මුදල් ගෙවීම හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව ඇති සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ, 2017 ක්වූ ඔක්තෝබර් මස 11 වැනි දින පෙරවරු 11.45 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දා වූ ද හාටන නැෂනල් බෑන්ක පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2014 නොවැම්බර් මස 14 වැනි දින සහතික කල අංක 4974 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉසුරු හොල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ් ණයකරු හැටියට සහ සුවන්ද ආරච්චිගේ සනත් කුමාර උකස්කරු හැටියට ඉසුරු හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. විසින් ප්‍රදානය කල ණය මුදල ආපසු ගෙවන බවට සුරකුමක් මෙහි පහත සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස් කර ඇත.

එසේ හෙයින් ඉහත සුවන්ද ආරච්චිගේ සනත් කුමාර යන අය ඉසුරු හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයා වශයෙන් එම සමාගමේ පාලනය හා කලමනාකරණය දරන බැවින් ඒ අනුව එකී සුවන්ද ආරච්චිගේ සනත් කුමාර යන අය එකී ඉසුරු හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ අතත්‍ය අයිතිකරු හා පාලනය දරන තැනත්තා වන අතර හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී විසින් ඉසුරු හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පහසුකම්වල නියම අරථලාභියා වනුයේ එකී සුවන්ද ආරච්චිගේ සනත් කුමාර යන අය වේ.

දේපළ:
බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, මොරටුව මහනගර සභා සීමාව තුළ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ දකුණු උයන 552 දරන ග්‍රාම නිලධාරී වසමේ මොරටුව හි පිහිටි උයන පාරේ වරිපනම් අංක 29/20 දරන පයාරුගහවත්ත හෙවත් 'වැටකෙයියාගහවත්ත' සහ කොටසක් වන මාදංගහවත්ත සහ පළුවීරගහවත්ත රෝස්බෑන්ක් ලෙස හඳුන්වන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් 2014 මැයි 09 වැනි දින පිළියෙළ කරන ලද අංක 966 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් ඒ දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම හයයි බින්දුව (අ:0, රූ:0, පර්:24.60) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සමඟ එහි ඇති සියලු දේත් වේ.

ඉහත සඳහන් ඉඩම් කොටස මෙහි පහත සඳහන් ඉඩම් කොටස් ඒකාබද්ධව සැදුම්ලත් වේ.

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මොරටුව මහනගර සභා සීමාව තුළ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරටුවෙහි පිහිටි දකුණු උයන 552 දරන ග්‍රාම නිලධාරි වසමේ මොරටුව ගමෙහි පිහිටි උයන පාරේ වරිපනම් අංක 31 දරන පයාරුගහවත්ත හෙවත් 'වැටකෙයියාගහවත්ත' සහ කොටසක් වන මාදංගහවත්ත සහ පළුවීරගහවත්ත රෝස්බෑන්ක් ලෙස හඳුන්වන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් 1995.04.08 වැනි දින පිළියෙළ කරන ලද අංක 1026 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 9 දරන නමුත් වඩාත් නිවැරදි බලයලත් මිනින්දෝරු එල්. පී. ලියනගේ විසින් 2013.06.20 වැනි දින පිළියෙල කරන ලද 715 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 9 දරන ඉඩමට මායිම් වූ කොටස් ප්‍රමාණය පර්චස් දොළහ (අ. 0, රූ.0, පර්.12) ක් විශාලත්වයෙන් යුත් ඉඩම සමග එහි ඇති සියලු දේත් වේ.

2. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මොරටුව මහනගර සභා සීමාව තුළ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු උයන 552 දරන ග්‍රාම නිලධාරි වසමේ මොරටුව ගමෙහි පිහිටි උයන පාරේ වරිපනම් අංක 29/20 දරන පයාරුගහවත්ත හෙවත් 'වැටකෙයියාගහවත්ත' සහ කොටසක් වන මාදංගහවත්ත සහ පළුවීරගහවත්ත රෝස්බෑන්ක් ලෙස හඳුන්වන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් 1995 ජනවාරි 08 සහ 1997 මාර්තු 13 වැනි දින පිළියෙළ කරන ලද අංක 1910 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 10 දරන පර්චස් දොළහයි දශම හයයි බින්දුව (අ.0, රූ.0, පර්.12.60) ක් විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලුම දේත් සමග වේ.

එකී අංක 4974 දරන උකස් බැඳුම්කරයේ 2 වන උපලේඛනයේ වඩාත් සවිස්තරව විස්තර කොට ඇති බලයලත් ඩබ්ලිව්. එල්. එච්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1910 සහ 1026 දරන පිඹුරුපත්වල නිරූපිත ලොට් 14 (මීටර් 6ක් පළල පාරක් සඳහා වෙන්කරන ලද) මතින් ප්‍රවේශ අයිතිය ද සමග වේ.

දේපලට පිවිසීම.- දෙහිවල මංසන්දියේ සිට ගාලු පාර ඔස්සේ මොරටුව කුරුස හන්දිය දක්වා පැමිණ දකුණට හැරී මීටර් 200 ක් පමණ ශාන්ත ජෝශප් වීදියේ ක්‍රිස්තියානි පල්ලිය දක්වා පැමිණ එතැනින් නැවත වරක් දකුණට හැරී මීටර් 200 ක් පමණ ඉදිරියට උයන පාර දිගේ තාර පාර දක්වා පැමිණ එතැනින් වමට හැරී මීටර් 20 ක් පමණ ඇතුළත තාර පාර දිගේ පැමිණි පසු එකී දේපලට ලඟාවිය හැකි අතර, එය දකුණු පස පිහිටා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා : 2017.06.16 වැනි දින 'ඩේලි මීරර්' හා 'ලක්බිම' සහ 'තිනකුරල්' පුවත්පත් බලන්න. එමෙන්ම වෙන්දේසි දැන්වීම සඳහා 2017.06.09 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(i) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
(ii) පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% ක(සියයට එකක) විකුණුම් බදු ද,
(iii) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ද,
(iv) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
(v) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 500.00 ක් ද,
(vi) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.00 ක් ද වේ.

තව ද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) ක් ඇතුලත හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. තව ද දින තිහක් (30) ක් ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපල නැවත විකිණීමට හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී බැංකුවට අයිතිය ඇත.

පහත සඳහන් අයගෙන් ඔප්පු පත්‍රිරු සහ අදාළ අනෙකුත් දේ ලබාගත හැක. ජ්‍යෙෂ්ඨ කළමනාකරු - වාණිජ අයකර ගැනීම්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, එච්. එන්. බී. ටවර්ස්, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661833, 2661826, 2661836

කේ. පී. එන්. සිල්වා, (සා.වි.)
උසාවි කොමසාරිස්,
රාජ්‍ය හා වානිජ බැංකු පිළිගත්
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු සහ තක්සේරුකරු.

'ඉන්ටස්ටේට් ඔක්ෂන්ස්'
අංක: 109/12 ඒ, ගෝතමී පාර, බෙරුල්ල, කොළඹ 08.
දුරකතන/ ෆැක්ස් : 011-2674626,
ජංගම : 077-1006829, 077-1316829
e-mail: premalalnsilva@gmail.com

09-607/3

---

**හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. - පංචිකාවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන, අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. බී. ඒ. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූද, 2013 නොවැම්බර් මස 01 වැනි දින සහ 2013 නොවැම්බර් මස 04 වැනි දින සහතික කළ අංක 1418 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දිල්ලිමුණි රිස්ලි රසාංජන් සිල්වා ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව, අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත මුදල් ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව ඇති සියලුම මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත සඳහන් නිශ්චල දේපල, 2017 ක්වූ ඔක්තෝබර් මස 13 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපල .-
බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රයිගම් පත්තුවේ ජා ඇල අංක 181/B ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රාගම, පොඩිවීකුඹුර ගමෙහි පිහිටි මිල්ලගහවත්ත ලොට් B නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු විසින් 2001 අගෝස්තු මස 18 වැනි දින පිළියෙල කරන ලද අංක 4483 දරන පිඹුරෙන් වෙන්කරන ලද ලොට් B වශයෙන් දැක්වෙන, විශාලත්වයෙන් පර්චස් තිස් දෙකයි (අ:0, රූ:0, පර්:32.00) ක් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේ.

බලයලත් මිනින්දෝරු එම්. ඩී, ජේ. පෙරේරා විසින් 1972 ජූලි මස 28 වැනි දින පිළියෙල කරන ලද අංක 4483 දරන පිඹුරෙන් බෙදා වෙන්කරන ලද ලොට් 4C දරන පාරක් සඳහා වෙන් කර ඇති කොටසේ ඇති මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා : 2017.03.21 වැනි දින 'ඩේලි මීරර්' හා 'ලක්බිම' සහ 'තිනකුරල්' පුවත්පත් බලන්න. එමෙන්ම වෙන්දේසි දැන්වීම සඳහා 2017.03.17 වැනි දින රජයේ ගැසට් පත්‍රය බලන්න.

දේපලට පිවිසීම.- රාගම නගරයේ සිට තේවත්ත පල්ලිය පාර දිගේ අරලිය උයන පාර තෙක් පැමිණ වම්පසින් ඇති අරලිය උයන පාරට හැරී මීටර් 350 ක් පමණ දුර ගමන් කළ විට හමුවන වැව (Lake Road) පාරට පැමිණ වම්පස ඇති වැව පාර දිගේ මීටර් 150 ක් පමණ ගමන් කළ පසු පොඩිවීකුඹුර පාර හමු වේ. එතැනින් වම්පසට ඇති පොඩිවීකුඹුර පාර දිගේ මීටර් 500 ක පමණ දුරින් ඇති බේකරිය පිහිටි ස්ථානයේ මෙම දේපල පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

(i) ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ද,
(ii) පළාත් පාලන අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ද,
(iii) වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු ද,
(iv) සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ද,
(v) ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව ලෙස රු. 500.00 ක් ද,
(vi) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.00 ක් ද වේ.

තව ද, ගැණුම් මිලෙන් සියයට අනූවක් (90%) ක් වූ ඉතිරි මුදල විකිණීමේ දින සිට දින (30) ක් ඇතුලත හැටන් නැෂනල් බෑනක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. තව ද දින තිහක් (30) ක් ඇතුළත ඉතිරි මුදල නොගෙව්වහොත් ගෙවා ඇති සියයට දහය (10%) ක මුදල අහිමි කිරීමට සහ එකී දේපල නැවත විකිණීමට හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී බැංකුවට අයිතිය ඇත.

පහත සඳහන් අයගෙන් හිමිකම් ඔප්පු/ පත්‍රිරු සහ අදාළ අනෙකුත් දේ ලබාගත හැක.

ජ්‍යෙෂ්ඨ කළමනාකරු - වාණිජ අයකර ගැනීම්, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, එච්. එන්. බී. ටවර්ස්, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661833, 2661826, 2661836

කේ. පී. එන්. සිල්වා, (සා.වි.),
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
හා උසාවි කොමසාරිස්.

'ඉන්ටස්ටේට් ඔක්ෂන්ස්'
අංක 109/12 ඒ, ගෝතමී පාර, බොරැල්ල,
කොළඹ 08.
දුරකතන/ ෆැක්ස් : 011-2674626,
ජංගම : 077-1006829, 077-1316829
e-mail: premalalnsilva@gmail.com

09-606

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී- යාපනය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ
4 වැනි වගන්තිය යටතේ පදිංචියට/ව්‍යාපාරයකට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය නගර සභා සීමාවේ අත්තියාඩි ජේ/78 ග්‍රාම නිලධාරි වසමේ චුන්ඩිකුලි කොට්ඨාසය තුල රසවින්තෝඩ්ඩම් පාරේ පිහිටි "ඉක්කිරිතෝඩ්ඩම්" නමැති ඉඩමට බලයලත් මානක එම් ඥාණපිරගාසම් විසින් 2015.08.26 වැනි දින අංක 2175 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට්ස් 1 සහ 2 නමැති ඒකාබද්දවූ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි නිවස සාප්පු දෙක ලිඳ ගහකොළ වගාව ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : වී. සී. ලච්චම්ස් දෙකයි සහ කුලීස් දහයයි දශම හයයි හයයි (02 Lms Vc & 10.66Kls)

මෙම දේපල යාපනයේ පදිංචි තිලගදාස් චන්ද්‍රපාල් යන අය ණයට ගන්නා සහ උකස්කරු වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපලට පිවිසීම.- යාපනය නගරයේ සිට ස්ටැන්ලි පාරේ නැගෙනහිර දෙසට කි.මී. 120 ක් පමණ රසවින්තෝඩ්ඩම් හන්දිය දක්වා පැමිණ එම රසවින්තෝඩ්ඩම් පාරේ දකුණු දිසාවට මීටර් 50 ක් පමණ ගමන් ගත් පසු අදාළ දේපල පිහිටා තිබේ. (යාපනය දුම්රිය ස්ථානය ආසන්නයේ)

2017 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.08.25 දින රජයේ ගැසට් පත්‍රයේ ද 2017.08.14 දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2500.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :කළමණාකරු මධ්‍යගත (ණය අයකිරීම් ), නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී., අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2448448

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 071-8446374/ 071-4962449
දුරකථන/ ෆැක්ස් :081-2210595

09-574

---

**නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ
4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී එල් සී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව බෝපිටියහි පදිංචි මංජු ශ්‍රී රවින්ද්‍ර බෝපිටිය ණයකරු වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී එල් සී නමින් හම්බන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච් ඒ ඒ ආර් පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 81 දරන උගස් බැඳුම්කරය මගින් උකස්කර ඇති පහත විස්තර කරන ලද දේපල එම දේපල පිහිටි බලන්ගොඩ කිරිමැටිතැන්න නිව් හොප්වෙල් එස්ටේට් පරිශ්‍රයේ දී 2017 ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දින පෙ. ව. 11.15 මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපල විස්තරය :

| *විස්තරය* | *නිමැවුම සහ ආකෘතිය* | *ප්‍රමාණය* | *නිෂ්පාදිත වර්ෂය* |
|---|---|---|---|
| එක්ස්කැවේටර් | බැකෝ/හටාචි- 200 | 01 | 2002 |

දේපලට පිවිසීම .- බලංගොඩ නගර මධ්‍යයේ සිට සුමංගලවැව පාරේ කි. මී. 03 ක් පමණ ගමන් ගෙන දකුණට හැරී වැලිගෙපොල පාරට පිවිස මෙම පාරේ කි. මී. 01 කේ කාණුව දක්වා ගමන් ගත් විට මෙම පාරට මායිම්ව පාරේ දකුණු පසින් අදාළ දේපල පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.08.25 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද 2017.08.14 දින දිවයින, අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :කළමණාකරු (මධ්‍යගත ණය අයකිරීම් අංශය ) නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී.එල්.සී. අංක. 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2448448.

අයි. ඩබ්ලිව්. ජයසූරිය
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1,දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595, 071-8446374/ 071-4962449

09-575

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මානිපායි ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ
4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මානිපායි ගමේ නිරිතදිග වලිකාමම් ප්‍රාදේශීය සභා සීමාවන් තුල නැගෙනහිර මානිපායි ග්‍රාම නිලධාරී වසම ජේ/ 138 කයාම්පුලි පටුමගේ පිහිටි සීමන් තෝඩ්ඩම් සහ මාවඩි තෝඩ්ඩම් නමැති ඉඩමට බලයලත් මානක ඒ. අරුල්නේසන් විසින් 2012.03.18 වැනි දින සාදන ලද අංක 1405 සී දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහ කොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය 02 එල්එම්එස් විසි සහ 16 කේඑල්එස් (02 Lms Vc & 16Kls)

මෙම දේපළ එබ්‍රහම් වෙතනායගම් සහ ප්‍රතේකා වෙතනායගම් යන අය බන්ධනදායීන් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දේපළට පිවිසීම.- යාපනය ප්‍රධාන බස් නැවතුම් ස්ථානයේ සිට කාරෙයිනගර් පාරේ මානිපායි ප්‍රාදේශීය සභා පරිශ්‍රය දක්වා පැමිණ ඒ අසලින් පිහිටි පටුමගට පිවිස වහාම එම පටුමගේ වම්පසින් පිහිටි දෙවන ඉඩම අදාළ දේපළ වේ. (නවාලි පාර හන්දියේ සිට මීටර් 50ක් පමණ දුර)

2017 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින ප. ව. 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.08.04 දින රජයේ ගැසට් පත්‍රය ද 2017.08.10 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය :- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 081-2210595 / 071-8446374/ 071-4962449

09-576

---

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2017 අංක 1093

MOD/DEF/02/01/ARF/PRO/MAG GEN/12.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් විල්ලද්දර ගමගේ ලාල් පද්මකුමාර, පීඑස්සී, එච්ඩීඑම්සී (නි/60394)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහන නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් විල්ලද්දර ගමගේ ලාල් පද්මකුමාර, පීඑස්සී, එච්ඩීඑම්සී (නි/60394)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 451/3

---

2017 අංක 1094

MOD/DEF/02/01/ARF/PRO/MAG GEN/12.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්, තනතුරු අත්හැරීම් හා පත් කිරීම්

**උසස් කිරීම්**

1. පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ නමට ඉදිරියෙන් දක්වා ඇති පරිදි උසස් කිරීම් අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) 2017 ජූලි මස 31 වැනි දින සිට තාවකාලික මේජර් ජෙනරාල් නිලයට :

බ්‍රිගේඩියර් ඒ එස් ඩී ලියනගේ, පීඑස්සී, එල්එස්සී, (නි/60392)

(ආ) 2017 අගෝස්තු මස 30 වැනි දින සිට මේජර් ජෙනරාල් නිලයට :

බ්‍රිගේඩියර් ඩබ් ජී එල් පද්මකුමාර, පීඑස්සී, එච්ඩීඑම්සී, (නි/60394)

**තනතුරු අත්හැරීම් හා පත්කිරීම්**

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ තනතුරු අත්හැරීම් හා පත්කිරීම් පහත දක්වා ඇති දින සිට ක්‍රියාත්මක කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

(අ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරාල්) ඒ එස් ඩී ලියනගේ, පීඑස්සී, එල්එස්සී, (නි/60392). යුද්ධ හමුද මූලස්ථානයේ අධ්‍යක්ෂ සැපයුම් හා ප්‍රවාහන තනතුර අත්හැරීම හා යුද්ධ හමුද මූලස්ථානයේ මූල්‍ය කළමනාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් 2017 ජූලි මස 31 වැනි දින සිට පත්කිරීම.

(අ) මේජර් ජෙනරාල් ඩබ් ජී එල් පද්මකුමාර, පීඑස්සී, එච්ඩීඑම්සී, (නි/60394). ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේ බ්‍රිගේඩියර් (පාලන හා භට කාර්‍යය සම්පාදක) තනතුර අත්හැරීම හා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් වශයෙන් 2017 අගෝස්තු මස 30 වැනි දින සිට පත්කිරීම.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 451/2

---

MOD/DEF/02/01/ARF/PRO/MAG GEN/12.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදව**

විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම වෙනුවෙන් පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ නිවේදනය අවලංගු කිරීම

**ගැසට් නිවේදනය අවලංගු කිරීම**

2017 ජූලි මස 21 දිනැති අංක 2029 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ විශ්‍රාම ගැනීමක් හා නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමකට අදළ 2017 අංක 870 (එම්ඕඩී/ඩීඊඑෆ්/02/01/ඒආර්එෆ්/ආර්ඊටී/1467) දරන ගැසට් නිවේදනය අතිගරු ජනාධිපති උතුමාණන් විසින් මෙයින් අවලංගු කරනු ලැබේ.

බ්‍රිගේඩියර් විල්ලද්දර ගමගේ ලාල් පද්මකුමාර, පීඑස්සී, එච්ඩීඑම්සී (නි/60394)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 451/1

---

2017 අංක 1095

MOD/DEF/02/01/ARF/RET/ 1490.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017 දෙසැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් (උපකරණ පාලක) සාලන් කපුගේ රම්‍යලාල් (නි/61924)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2017 දෙසැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් (උපකරණ පාලක) සාලන් කපුගේ රම්‍යලාල් (නි/61924)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 494

---

2017 අංක 1096

MOD/DEF/02/01/ARF/RET/ 1489.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2017 නොවැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් සිංහලගේ ජයසූරිය අමරසිංහ, ආර්ඩබ්පී, ආර්එස්පී ශ්‍රීලංසිරෙ (නි/67130)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 493

---

2017 අංක 1097

MOD/DEF/03/02/PRO/RNF/04/05.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2017 අගෝස්තු මස 31 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන් :

කොමදෝරු උදය බිංදු සුමනසේකර, ආර්එස්පී, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0235

2017 සැප්තැම්බර් මස 11 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන් :

කොමදෝරු වනිග ආරච්චිගේ සුජීව සිරිනාථ පෙරේරා, ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0255

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 496

---

2017 අංක 1098

MOD/DEF/03/02/RNF/ 04/04.

**ශ්‍රී ලංකා නාවික හමුදව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

2017 සැප්තැම්බර් මස 11 වැනි දින සිට තාවකාලික රියර් අද්මිරාල් වශයෙන් :

කොමදෝරු උස්හෙට්ටිගේ සුජීව රුවන් පෙරේරා, ආර්එස්පී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0321

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 495

---

2017 අංක 1099

MOD/DEF/03/02/PRO/RNF/ 01/11.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

2017 මැයි මස 10 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ දිමුතු ප්‍රසන්න දේශප්‍රිය, එන්ආර්එක්ස් 2440, ශ්‍රීලංනාහ

2017 මැයි මස 24 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් :

ලුතිනන් (ඉ) කවිසේකර මුදියන්සේලාගේ නුවන් කවිසේකර, එන්ආර්ඊ 2449, ශ්‍රීලංනාහ

2017 මැයි මස 24 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (වි) වශයෙන් :

ලුතිනන් (වි) එදුසූරිය ආරච්චිගේ ශ්‍රීමාල් හෂාන්ත විජේසිංහ, එන්ආර්එල් 2454, ශ්‍රීලංනාහ

2017 මැයි මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් වශයෙන් :

ලුතිනන් සම්මු ක්‍රිශාන්ත ප්‍රදීප් කුමාර, එන්ආර්එක්ස් 2443, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 ජූලි මස 13 වැනි දින,
කොළඹ දී ය.

09 - 580

---

2017 අංක 1100

MOD/DEF/03/02/EX.

**ශ්‍රී ලංකා නාවික හමුදව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීමක්

2017 අගෝස්තු මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුද ස්වේච්ඡා නාවික බලකායේ සිට ස්වේච්ඡා නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) රණසිංහගේ විජේපාල රණසිංහ, එන්වීඑක්ස් 5407, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 ජුනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

09 - 579

2017 අංක 1101

MOD/DEF/10/03/RET/177.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
නිත්‍ය උපසේවයට මාරු කිරීමක්

2017 සැප්තැම්බර් මස 24 වැනි දින පහත නම සඳහන් නිලධාරියා නිත්‍ය ගුවන් හමුද සේවයේ සිට නිත්‍ය උපසේවයට මාරු කරන ලදී.

එයාර් වයිස් මාර්ෂල් ජනක් ප්‍රසන්න වනිගතුංග (01416) - විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 584/2

---

2017 අංක 1102

MOD/DEF/10/03/RET/177.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2017 සැප්තැම්බර් මස 24 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එයාර් වයිස් මාර්ෂල් ජනක් ප්‍රසන්න වනිගතුංග (01416) - විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 584/1

---

2017 අංක 1103

MOD/DEF/10/03/PRO/03.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

තාවකාලික ගෲප් කැප්ටන් නිලූකා දයානි බර්නඩෙන් අබේසේකර (01876) වෛද්‍ය 2017.09.01
තාවකාලික ගෲප් කැප්ටන් ගමගේ හර්ෂ ප්‍රියන්ත නානායක්කාර (01733) පරි/රෙජි 2017.09.01
තාවකාලික ගෲප් කැප්ටන් මාකාවිටගේ ජූඩ් රොනී පෙරේරා (01751) විද්‍යුත්/ඉංජි 2017.09.21

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 578

---

2017 අංක 1104

MOD/DEF/10/03/PRO/3T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

ස්ථිර විංග් කමාන්ඩර් සේනාධීර පතිරන්නැහැලාගේ වජිර කුමාර සේනාධීර (01956) පරි/රෙජි 2017.07.01

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 448

---

2017 අංක 1105

MOD/DEF/10/03/PRO/13.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා (යුධ ආබාධිත) ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

ස්ථිර ස්කොඩ්රන් ලීඩර් ධනුෂ්ක ප්‍රදීප් තලකැටිය (02194) පරිපාලන/රෙජි 2017.12.30

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 577

---

2017 අංක 1106

MOD/DEF/10/03/PRO/2T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

ස්ථිර ස්කොඩ්රන් ලීඩර් චමින්ද දෙඩංදෙනිය (02166) කාර්මික/ඉංජි 2017.03.23
ස්ථිර ස්කොඩ්රන් ලීඩර් මීවිටි ආරච්චිගේ දෙන් චමිල ඉරංග ගුණසිංහ (02261) කාර්මික/ඉංජි 2017.07.25

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 450

---

2017 අංක 1107

MOD/DEF/10/03/PRO/01.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් තුසියදුර නිර්මාල් ප්‍රභාත් ද සිල්වා (02379) කාර්මික/ඉංජි 2017.09.01
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ජයකොඩි ආරච්චිගේ සුමිත් ප්‍රියංකර (02553) පරි/රෙජි 2017.10.07
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් ෆ්‍රැන්සිස්කු හෙට්ටිගේ අමිල සුරංජන් සිල්වා (02551) පරිපාලන 2017.10.07
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් චරිත් චතුරංග තල්පේ ගමගේ (02608) කාර්මික/ඉංජි 2017.12.04
තාවකාලික ස්කොඩ්රන් ලීඩර් කඩවත්ගම ඇතුගලගේ නවීන් ධනුෂ්ක ගුණරත්න (02609) කාර්මික/ඉංජි 2017.12.04

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 581

---

2017 අංක 1108

MOD/DEF/10/03/RET/178.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීමක්

2018 ජනවාරි මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ස්කොඩ්රන් ලීඩර් කාරියප්පෙරුම මුදියන්සේලාගේ සාගර විජිත කුමාර කාරියප්පෙරුම (02090) - පරිපාලන රෙජිමේන්තු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 585

---

2017 අංක 1109

MOD/DEF/10/03/PRO/1T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් උඩුකලගේ ධම්මික ආරියසේන (02427) මෙහෙ/ගුවන් 2017.01.20

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 582

---

2017 අංක 1110

MOD/DEF/10/03/PRO/1T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම් වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නාරංකොටුවේ අලුත් ගෙදර ශාන්ත ප්‍රිය ඔබේසේකර (02729) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් අගලකොටුවේ මුදියන්සේලාගේ නිශාන්ත ඉන්දික වික්‍රමසිංහ (02730) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් චන්‍ද්‍රසේකර මුදියන්සේලාගේ චානක බණ්ඩාර චන්‍ද්‍රසේකර (02732) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සෙම්බුකුට්ටිගේ චමින්ද ලක්මාල් සේනාරත්න (02733) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් පල්ලිය ගුරුගේ උපුල් කුමාර (02734) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රත්නමලල ඉරුගල් බණ්ඩාරලාගේ රත්නායක (02736) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් විජේසූරිය මුදියන්සේලාගේ සංජීව සම්පත් විජේසූරිය (02737) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් චමිල් ප්‍රසන්න ගෝනපිනුවලගේ (02738) පරි/රෙජි 2017.09.25
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් වන්නිආරච්චිගේ දෙන් සංජය රවිනාත වන්නිආරච්චි (02744) විද්‍යුත්/ඉංජි 2017.11.05
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් චමිර එරන්ද නෙත්තිකුමාර (03490) පරි/වෛද්‍ය 2017.11.14
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ලීලන්ති නිරෝධ රන්දෙනි (03492) පරි/නීති 2017.11.14
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හේවා අලංකාරගේ රුවන් නිර්මාල් වික්‍රමරත්න (03493) පරි/නීති 2017.11.14
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රාජකරුණා අබේරත්න හේරත් මුදියන්සේලාගේ චන්දන තිලක් බණ්ඩාර නවත්තේගම (02768) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ජයසිංහ ආරච්චිගේ ශ්‍රීලාල් ජයසිංහ (02770) පරි/රෙජි 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හත්ගිලි ගෙදර දිලන්ත සජිත් ආරියදස (02771) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් කෝට්ටයලාගේ රෝහිත ලක්ෂ්මන් (02772) පරි/රෙජි 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් රසික දුමින්ද වීරරත්න ජයසූරිය (02773) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් විදනයලාගේ ගෙදර බුද්ධික සංජීව පෙතියගොඩ (02775) පරි/රෙජි 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මුදුන්කොටුවේ දසනායක මුදියන්සේලාගේ රණවංශ බණ්ඩාර දසනායක (02776) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් පිටවෙලගේ ජනක විජේන්ද්‍ර ලක්ෂ්මන් පිටවල (02777) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් සංජීව ප්‍රියංකර දේවගේ (02778) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මොහමඩ් අබ්දුල්ලා අබ්දුල් කෆූර් (02780) පරිපාලන 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් මද්දුමාගේ දෙන් උපුල් ප්‍රියන්ත ගුණවර්ධන (02781) පරි/රෙජි 2017.12.29
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් යටවර බුලත්වත්තේ වලව්වේ දිසානායක මුදියන්සේලාගේ චතුර්වර්ණ විද්‍යුදනී යටවර (OW/01087) කාර්මික/ඉංජි 2017.12.31

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

09 - 583

---

2017 අංක 1111

MOD/DEF/10/03/TRN/01/2017.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිත්‍ය ගුවන් හමුදාවට මාරු කිරීමක්

2017 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරිනියගේ නිත්‍ය ගුවන් හමුදාවට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ස්කොඩ්‍රන් ලීඩර් දෙල්ගොඩ ලියනගේ සඳරා චතුරංගිකා ලියනගේ (වී/0522) - දන්ත වෛද්‍ය ශාඛාව

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කපිල වෛද්‍යරත්න, ජනාධිපති නීතිඥ,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2017 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

09 - 449

## වෙනත් පත්කිරීම් ආදිය

2017 අංක 1112

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බල සේනාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2017 මාර්තු මස 30 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් බණ කියනගේ සුරේෂ් චමින්ද ගැහේබ (නි/4931)

ඒ ඩබ් ජේ සී ද සිල්වා, ආර්ඩබ්ලිව්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2017 අප්‍රේල් මස 30 වැනි දින.

09 - 431/1

---

2017 අංක 1113

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බල සේනාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2017 අප්‍රේල් මස 26 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් සියසිංහ මුදියන්සේලාගේ රවීන්‍ද්‍ර රාමනායක ශ්‍රීලංසිරෙ (නි/7496)

එන් යූ එම් එම් ඩබ්ලිව් සේනානායක,
ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2017 ජූලි මස 27 වැනි දින.

09 - 431/2

---

2017 අංක 1114

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බල සේනාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2017 ජූලි මස 31 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් සෝමරත්නගේ අජිත් කුමාර සෝමරත්න, ශ්‍රීලපාහ (නි/7531)

ඒ ඩබ් ජේ සී ද සිල්වා, ආර්ඩබ්ලිව්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2017 අප්‍රේල් මස 30 වැනි දින.

09 - 431/3

---

2017 අංක 1115

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බල සේනාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2017 අගෝස්තු මස 31 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් වගපේලි ගෙදර සුනිල් කුමාර, ශ්‍රීලපාහ (නි/6924)

ඒ ඩබ්ලිව් ජේ සී ද සිල්වා, ආර්ඩබ්ලිව්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2017 ජුනි මස 22 වැනි දින.

09 - 431/4

---

2017 අංක 1116

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බල සේනාව**

යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරි 2017 ඔක්තෝබර් මස 30 වැනි දින සිට කපිතන් නිලයේ නිල ස්ථිර කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කර ඇත.

තාවකාලික කපිතන් වීරසිංහ මුදියන්සේලාගේ සුදත් ආනන්ද වීරසිංහ, ශ්‍රීලංජාආබමු (නි/5108)

ඒ ඩබ්ලිව් ජේ සී ද සිල්වා, ආර්ඩබ්ලිව්පී,
වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2017 ජුනි මස 22 වැනි දින.

09 - 431/5

---

## රජයේ නිවේදන

**ආයිතියමලේ සදසරණ මැණියෝ දේවස්ථාන**

වාර්ෂික උත්සවය - 2017

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1991 නොවැම්බර් මස 01 වැනි දිනැති අංක 687 දරන ගැසට් පත්‍රයේ පළ කර තිබූ නිවේදනය අනුව යාත්‍රා ආඥපනතේ 2 වැනි වගන්තිය (175 වන අධිකාරය වූ) යටතේ ආයිතියමලේ සදසරණ මැණියෝ දේවස්ථානයේ වාර්ෂික උත්සවය මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2017.08.25 වැනි ද කොඩි එසවීමෙන් ආරම්භ වී 2017.09.03 වැනිද තෙක් පැවැත්වේයැයි මෙයින් ප්‍රකාශ කරමි.

එස්. සුතාකර්,
ප්‍රාදේශීය ලේකම්.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මන්මුනේ බටහිර,
වව්නතිව්.

09 - 428

**ඓතිහාසික සිත්තම්ගල්ලෙන රජමහා විහාරස්ථ ඇසළ මහා පෙරහැර නියෝග**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 175 වැනි අධිකරණ වූ වන්දනා ගමන් ආඥපනත 2 වැනි වගන්තිය සාදනු ලබන නියෝග ප්‍රකාරව වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් අයි. ආර්. කේ. විතාරණ වන මම පහත සඳහන් කාලය වලස්මුල්ල සිත්තම්ගල්ලෙන රජමහා විහාරස්ථාන වන්දනා ගමන් ආඥපනත යටතේ රෙගුලාසි බල පවත්නා කාලය වශයෙන් නියම කරයි.

2017 වර්ෂයේ ඇසළ මහා පෙරහැර මංගල්‍යය 2017.10.01 වැනි දින සිට 2017.10.07 වැනි දින දක්වා ක්‍රියාත්මක වේ.

අයි. ආර්. කේ. විතාරණ,
ප්‍රාදේශීය ලේකම්,
වලස්මුල්ල.

09 - 545

---

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගණුදෙනුකරුගේ නම : ඊ. එම්. ඩී. කරුණාරත්න සහ ආර්. ජී. එස්. ජී. සමරවික්‍රම.
ගිණුම් අංක : 1009 5010 7949.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017 ක් වූ ජුනි මස 29 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමක දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රම්‍යා අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2012 සැප්තැම්බර් මස 28 දතම හා අංක 3654 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනැවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකනායක මුදියන්සේලාගේ ධර්මවංශ කරුණාරත්න සහ රූබසිංහ ගමච්චිගේ සද්නා ගයානි සමරවික්‍රම යන අය බන්ධනදැයීන් වශයෙන් හා එකී ඒකනායක මුදියන්සේලාගේ ධර්මවංශ කරුණාරත්න යන අය උකස්කරු වශයෙන්ද පැහැර ඇති හෙයින්ද, එකී අංක. 3654 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තිස් නම ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය හැට අටයි ශත හැත්තෑ හතක (රු. 3,943,768.77) මුදලක් 2017 මැයි මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් තිස් නම ලක්ෂ හතලිස් තුන් දහස් හත්සිය හැට අටයි ශත හැත්තෑ හතක (රු. 3, 943, 768.77) මුදලද, 2017 මැයි මස 13 දින සිට අංක 3654 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් අට ලක්ෂ තුන්සිය අනූ හයයි ශත දහ අටක (රු. 3,800,396.18) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 3654 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා (අතුරුගිරිය උප සීමාවන්) සීමාවන් තුළ හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, දකුණු හෝකන්දර ග්‍රාමයේ පිහිටි "දෙල්ගහවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. රාසප්පා යන අය විසින් සාදන ලද 1998 සැප්තැම්බර් මස 03 දතම හා අංක 17/98 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන්කොට ලොට් 6B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මානක තැන පී. එච්. පෙරේරා යන අය විසින් සාදන ලද අංක 1250 දරන පිඹුරේ ලොට් 4 (අඩි 15 පළල පාර සඳහා වෙන්කිරීම), නැගෙනහිරට : අංක 1250 දරන එකී පිඹුරේ ලොට් 7 ද, දකුණට : ජයවික්‍රම වේරගල යන අය විසින් හිමිකම් කියනු ලබන දෙල්ගහවත්ත සහ බස්නාහිරට : ලොට් 6A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක 17/98 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 1227/85 යටතේ හෝමාගම ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයත් මානක තැන පී. එච්. පෙරේරා යන අය විසින් සාදන ලද 1991 ඔක්තෝබර් 17 දින සත්‍ය පිටපතක් වශයෙන් සහතික කොට ඇති සහ 1989 ජූලි 25 දතම හා අංක 1250 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

09 - 546

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු බැගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ඩබ්ලිව්. ඩී. සී. ප්‍රනාන්දු
ගිණුම් අංක : 0140 5000 1785

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2017 ක් වූ අගෝස්තු මස 31 වැනි දින පැවැත්වූ රැස්වීමක දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. බී. ගමගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2015 පෙබරවාරි මස 06 දතම හා අංක 791 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනැවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වික්‍රමආරච්චිගේ දිනේෂ් චාමර ප්‍රනාන්දු යන අය බන්ධනදැයීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද එකී අංක 791 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තිස් තුන් ලක්ෂ හැත්තෑ පන් දහස් හත්සිය හතලිස් හතයි ශත අසූ හයක (රු. 33,75,747.86) මුදලක් 2017 අගෝස්තු මස 10 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් තිස් තුන් ලක්ෂ හැත්තෑ පන් දහස් හත්සිය හතලිස් හතයි ශත අසූ හයක (රු. 33,75,747.86) මුදලද, 2017 අගෝස්තු මස 11 දින සිට අංක 791 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් එක් ලක්ෂ පනස් තුන් දහස් එකසිය හැත්තෑ අටයි ශත හතලිස් එකක (රු. 31,53,178.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහක් (11%) ක් බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 791 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ අධිකාරි පත්තුවේ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ බණ්ඩාරගම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ ගැලනිගම ග්‍රාම නිලධාරි කොට්ඨසය තුළ (ග්‍රා.නි.කො. අංක 661) රයිගම පිහිටි ගොනාකැලේවත්ත සහ ගොනාකැලේ ඕවිට යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. ඒ. පී. ජයසූරිය යන අය විසින් සාදන ලද 2015 ජනවාරි මස 29 දතම හා අංක 6505 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 11 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මානක තැන ඩී. එච්. ඇතුලත්මුදලි යන අය විසින් සාදන ලද අංක 2001 දෙසැම්බර් 26 දතම හා අංක 3745 දරන පිඹුරේ නිරූපිත ලොට් 15 ද, නැගෙනහිරට : අංක 3745 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 10 ද, දකුණට : වාහලකුඹුර සහ ඕවිට සහ බස්නාහිරට : අංක 3745 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 14 සහ 12 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි නමයයි දශම හයක් (අ. 0, රූ.0, පර්. 29.6) ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ එකී අංක 6505 දරන පිඹුරට අනුවය.

අංක 6505 දරන එකී පිඹුරේ එකී ලොට් 11 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

